# නිබ්බානගාමී පටිපදාව 15-11-2023

## නිවනට යනමගෙහි පියවර සතරකිඃ

1)-**ත්‍රිලක්‍ෂණයඃ** **ප්‍රඥාවෙන්** අවබෝධවීම/ **වීරියයෙන්** අවබෝධකරගැනීම

2)-**සත්‍යසතරඃ** **ප්‍රඥාවෙන්** අවබෝධවීම/ **ශ්‍රද්ධාවෙන්** පිළිගැනීම

3)-**ආර්යඅෂ්ඨාංගික මාර්ගයඃ** **ප්‍රඥා** ප්‍රත්‍යක්‍ෂ ගමන/**ශීල** පටිපදා හැසිරීම

4)-**පටිච්ච සමුත්පාද ධර්මයඃ** **ප්‍රඥා** ප්‍රත්‍යක්‍ෂ අවබෝධය/**වීර්යය** ප්‍රත්‍යක්‍ෂ අවබෝධය

## ලිපියෙහි අරමුණඃ

දිවියෙහි නිරර්ථක බව හොඳින්ම වැටහීගියද, ඇතැම්විට මැදිවියද ඉක්මවා හෝ විශ්‍රාමිකව සිටිනා ජීවිත අත්දැකීම් බහුල බුද්ධිමත් උගත් බොහෝපිරිසක් **නිවන්මගට** අවතීර්ණ වීමට මැලිකමක් දක්වීමට හේතුඇතිබව පෙනීයයි.

- මෙතෙක් ගතකළ දිවිසැරීයෙහි තමන් විසින් වර්ධනයකරගත් විෂයපථයන්හි **නිවන** යන අධ්‍යාත්මික සංදර්භයක **අවශ්‍යතාවයක්** හෝ එවැන්නකට ඉඩකඩක් නොවීම
- තමනට කලින් නිවන් මාර්ගයට පිළිපන් ඇතැම් සහෘදයින් තමන් මාර්ගඵල ලදබව හැඟවීමට දක්වන උග්‍ර **ශීලචර්යාවන්ද** , සංඛ්‍යාවලින් පාඩම්කරගත නොහැකිතරම් අනවශ්‍ය අසුභාරදාහක් **විභජ්ජ ධර්මස්කන්ධයන්** දන්නාබව ගෙනහැරපාමින් දක්වන ශිල්පහරඹයන්ද, ඔවුන් විසින් සිදුකරනාලද නොයෙක් **විශ්වකර්ම පුදපූජාවන්** පිළිබඳ පුරසාරම්ද ඇසීමෙන් අද බහුතරයක් විචක්‍ෂණශීලී මධ්‍යස්ථ ගිහිසමාජය සමස්ථ **බුද්ධාගම** කෙරෙහිම කළකිරීමට පත්වසිටීම
- දේශකයන් වහන්සේලා බොහෝවිට ගිහියන් කිසිදුදෙයක් නොදන්නා දහම්පාසල් ළමයින්සේ සලකා මව්ගුණවරුනා, පවුල්ජීවිත උපදෙස්, දේශපාලන හා ජාතකකතා අනුසාරයෙන්කරනා **තමන්ගේ දෘෂ්ඨිදේශනාවන්** කෙරෙහි කළකිරීමට පත්වසිටීම
- නිවන යනු **පාලිබස** නොදැන, උග්‍ර ශීල භාවනා **වැඩසටහන් නොවඩා**, ලෝබකම දුරලා මුදල් යහමින් **පූජාකර මිසක** මෙලෝආත්මයක ලඟාවියනොහැකි දුරස්ථ **ප්‍රාර්ථනා යතාර්ථයක්** පමණක් බවට අපතුල ඇතිකරවනලද **මිත්‍යා දෘෂ්ඨිය**

එදා ජීවමාණ බුදුන්දවස **සනාථන විමුක්ති ජීවන දර්ශණයක්වූ** බුදුදහම ගැටෙන්නට තවත් එක් **ඇදහිල්ලක්** නොවූයෙන් **විද්‍යාත්මක විෂයක්** සේ විදෙස්හිපවා පැතිරගියේ **අර්ථයෙන් ධර්මයෙන්** හා **චර්යාවෙන්** එය සමාජගත කිරීමේ **බුද්ධවරම** ලද ප්‍රථම **මහරහත්** සඟසැටනම ලොව අටදික්භාගයන්හි **මානවජනාවසයන්** සොයා වැඩමකොට දියත්කළ දැවැන්ත **අධ්‍යාත්මික විප්ලවය** හේතුවෙනි.

**බුද්ධයුගයේදී** ඉපැරණි **හෙළබස** පාදකකොට එහිම වැඩිදියුණක්වූ **මාගධී** බසින් ප්‍රකාශිත **විමුක්ති දර්ශණය** පසුකාලීණව විදෙස් භාෂාවන්ට පෙරළනුලැබ, නොයෙක් නිකාය දෘෂ්ඨීනට හා දේවආගමික ඇදහීම් සම්ප්‍රදායනට අනුගතව අද අපඅතට සැපත්වඇත. එම **ආගමට** අනුවනම් **නිවන** යනු දුරස්ථ **ප්‍රාර්ථනා පරමාර්ථයක්ම** පමණකි.

එසේවුවද එහි පසුකාලීණ විකෘතීන් විනිවිදදැක සාරය උකහාගැනීමට **ජානමය සමත්කම්** ලද අතලොස්සක් වියත් සඝරුවන් අදටත් හෙළදෙරණෙහි වැඩවසනබව සැකහැර හෙළිකරනු කැමැත්තෙමි.

එබැවින් මෙම ලිපිය සකස්කෙරෙනුයේ හුදෙක් දිවිමගෙහි **පරිණත වියත් ප්‍රඥාසම්පන්න** ගිහිභවතුන්ගේ පරිශීලණය උදෙසාම බව කාරුණිකව සලකන්න. මෙහිදී **නිවන** යනු **ප්‍රාර්ථනා පරමාර්ථයක්** පමණක් නොව, මෙලොවදීම එලනෙලාගතහැකි **සාධනීය යථාරථයක්** බව වටහාදීමට ප්‍රයත්නයක් දැරෙයි ;

1)-නිබ්බානගාමී **අභිලාශය** සිතෙහි ඇතිකිරීම 2)-**භාෂාවේ දුරස්ථබව** නැතිකිරීමෙන් නිබ්බානගාමී පියවර සතර **සරළව** තේරුම්ගැනීමට සැලැස්වීම 3)-සියවස් 26ක් පැරණි **නිවන්මග දේශිතය** විසිඑක්වන සියවසෙහි මානවයාගේ විද්‍යාත්මක චින්තනපරිචයට ගලපාලීම හා 4)-සම්මතයේ ඇති රූක්ෂ ශීල **පඨිපදාවන්** සපිරීම හෝ අසුභාරදාහක් **ධර්මස්කන්ධය** වනපොත්කිරීම වෙනුවට **විදස්සනාප්‍රඥාව** අවදිකිරීමතුලින් **ප්‍රඥාවිමුක්තියේ මාර්ගඵල** මෙලොවදීම අත්විදීමට සැලැස්වීම මෙනයින් උදක්ම අරමුණු කෙරෙයි.

## <u>පෙරමග සටහන්ඃ</u>

- **මාගධී** යනුඃ <u>**මග්ග**(මාර්ගය) +**ඉද්ධි**(මගඵල Enlightenments) = **මග්ගඉද්ධි** = **මාගධී**</u> ලෙසින් නිවනෙහි මගඵල පිණිස **ශබ්ධ සංඥාවන්** මනාව උපයෝගීකොටගත් සියළුම බුදුවරුන් විසින් නිවන්මග පෙන්වාදීමට උපයෝගීකොටගැනෙනා භාෂාවයි.

  **මාගධී හෙළබසින්** බුදුන්වහන්සේ විසින් දේශණාකොට වදාල ධර්මය අපට මෙතරම් සමීපබවක් දැනෙනුයේ එය **සිංහළ** භාශාවෙහි ප්‍රභවය වනබැවින්ය. සිංහළ පමණක් නොව දෙමළ, මළයාලම්, හින්දි ආදී සියළු දකුණුආසියාතික භාෂාවන්හි ප්‍රභවය **හෙළබස** වෙයි.

  දකුණුආසියාතික **ආදිමානව සම්භවය** පිළිබඳ පුරාවිද්‍යාත්මක සාධක ශ්‍රී ලංකාවේ **සබරගමු හෙළයේ** පටන් ඉංදියාවේ **කේරළය** හා **මධ්‍යප්‍රදේශ්** දක්වාදිවෙන කඳුවැටිය ආශ්‍රිත කැනීම්වලදී හමුවීඇත. එබැවින් දකුණු ආසියාතික ආදිමානව ප්‍රභව ශිෂ්ඨාචාරය පොදුවේ **'ඉංදු-ලංකා හෙළ ආදිමානව ශිෂ්ඨාචාරය-Indu-Lanka Hela Source Civillization'** ලෙස නම්කළහැකිය. http://www.cyrilhtgamage.com/index.php/publication-engineering/88-publication/191-indu-lanka-civilization-of-prehistoric-mountainous-hela-cultural-source

  ඉංදියාවේ පැවති ඉපැරණි **සංස්කෘත** බසෙහි මධ්‍යකාලීන ව්‍යුත්පන්නයක්වූ (ක්‍රි පූ 2-3 සියවස) **පාලිබසට,** අපගේ **හෙළබසින්** ලිඛිතව පැවති ත්‍රිපිටකධර්මය පරිවර්ථනය කිරීම ඉතිහාසයේ අවස්ථාවන් දෙකකදී සිදුවඇතිබව අපවිසින් කරණලද ස්වාධීන ඓතිහාසික මූලාශ්‍ර විශ්ලේෂණයේදී පැහැදිළිවගිය කරුණකි;

| English ඉංග්‍රීසි | <5000 BP<br>Helabasa Brahmi Source<br>හෙළබස/බ්‍රාහ්මී අක්ෂර | <2600 BP<br>Magadhi Helabasa<br>මාගධී හෙළබස | P<br>Present Sinhala<br>වර්තමාන සිංහල බස | P<br>Tamil (Dravida)<br>වර්තමාන දෙමළ බස | P<br>Hindi<br>හින්දි බස | <2500 BP<br>Sanskrit<br>සංස්කෘත බස | ≈2300BP<br>Pali<br>පාලි බස | Arabic<br>අරාබි බස |
|---|---|---|---|---|---|---|---|---|
| a | 𑀅 | अ | අ a | அ | अ | 𑀅 | अ | ا |
| ā | 𑀆 | आ | ආ ā | ஆ | आ | 𑀆 | आ | أ |
| i | 𑀇 | ई | ඉ i | இ | इ | 𑀇 | ई | يِ |
| u | 𑀉 | उ | උ u | உ | उ | 𑀉 | उ | و |
| ū | 𑀊 | ऊ | ඌ ū | ஊ | ऊ | 𑀊 | ऊ | ى |

**Figure-(Helabasa centric evolution of South Asian languages)**
රූපසටහන-(හෙළබස කේන්ද්‍රීය දකුණු ආසියානු භාෂාවන්හි පරිණාමය)

1)- අශෝක රජතුමන් බුද්ධදර්ශණයට පැහැදී එය **ආගම** වශයෙන් වැළඳගත්පසුව (ක්‍රි පූ දෙවන සියවස) වෙහෙරවිහාර විශාලප්‍රමාණයක් කරවා මහා **ධර්මසංගායනාවක්ද** ඉංදියාවෙහි සිදුකළහ. **චන්ද්‍රගුප්ත මෞර්යය** රාජයා විසින්( ක්‍රි පූ 4-5 වැනි සියවස) ආර්යයයන්ගෙන් ***භාරතය** ගලවාගත් අවදියේ නැවත ජනයා තම ආවේණීය හින්දු ආගමට තදින්ම ඇලීසිටි යුගයක ඔවුන් **බුද්ධාගමට** හැරවීමට අශෝක රජතුමාට මහත්වෙහෙසක් දැරීමට සිදුවූබව ඉන්දීය ඉතිහාසඥයන් අන්තර්ජාලයෙහි පවා පෙන්වාදී ඇත. (හෙළබස් විශ්ලේශණයෙන් භාරත යන නම හා ඉන්දියාවේ බොහෝ ප්‍රදේශ නාමයන්හි සම්භවය අර්ථදැක්විය හැකි අතර එනයින් පැහැදිළිවන්නේද ආදිමානව **හෙළබස** ඉංදුලංකා ප්‍රභව මානවශ්ෂ්ඨාචාරයේ පොදු බසවූබවය)

*__බහු__(බොහෝ) +__රට්ඨ__(ප්‍රාන්තරජයන්) =__බහ්රට්ට__ => **භාරත**(බහු ප්‍රාන්ත රට)

**Bahu**(many) +**Ratta**(kindoms)= **Bahratta** =>**Bharata** =.**Bharat**

එබැවින් අශෝක රජතුමන් තම ජනයාට තේරුම්ගැනීමට පහසුකරවනු පිණිස **සංස්කෘත** හා **මාගධිහෙළ** බස්හි සංකළණයක් වන '**පාලි**' බසින් ත්‍රිපිටක ධර්මය පිටපත්කොට

මොග්ගලීපුත්තතිස්ස තෙරුන්ගේද අනුශාසකත්වයෙන් ආසියාතික රටවල ධර්මප්‍රචාරයට කටයුතු සලසනලදහ.

2)- දෙවනවරට එය සිදුවූයේ මෑතකදී(ක්‍රිව 410-432)මහානාම රජසමයේ **බිහාරයේ** සිට පැමිණි බුද්ධගෝෂනම් හිමියන් විසිනි. අනුරාධපුර මහාවිහාර විශ්වවිද්‍යාල පරිශ්‍රයෙහිවූ දැවමය සත්මහල් පොත්ගුල් ප්‍රාසාදය(පසුව ගිනිබත්කරණලද ලෝවාමහාපාය) තුලවූ **හෙළබසින්** ග්‍රන්ථාරූඪ **ථේරවාද අභිධර්ම පිටකය** බුද්ධගෝෂ හිමියන් විසින් එසේ පාලිබසට පෙරළිමේදී විකෘතීන් බොහොමයකට ලක්ව ඇතිබව අදවනවිට අපරට වියත් ප්‍රඥාවන්ත ගිහිපැවිදි දෙපාර්ශවයම එකසේ අවබෝධ කොටගෙනඇති කරුණකි.

ඒ බව මැනැවින් සනාථවන්නේ ඉතාගැඹුරින් අභිධර්මයෙහි නිවන්පඨිපදාව අවබෝධකොට '**නිවනේ නිවීම**' මැයින් ධර්ම දේශනාවන් 59ක් සිදුකළ 'අපවත්වීවදාල **කටුකුරුන්දේ ඤාණානන්ද** (මගඵලලාභී) හිමියන් හා මීරිගම 'පරමනිබ්බාන' ධර්මායතනය පිහිටුවා නිවනේ සබෑ **ථේරවාදී** සදහම්බෙරය හඬවනා **මීමනපලාන සිරිධම්මාලංකාර** (අරහත්) හිමියන්ගේ දේශනා හා ග්‍රන්ථකරණයන්ගෙනි.

තවද විචාර බුද්ධිසම්පන්න පාඨකයාගේ අවධානයට පාත්‍රවියයුතු කරුණක්වන්නේ බටහිර ආක්‍රමණ හමුවේ ලක්වැසියන් සමාජආර්ථික හා සදාචාරයේ අගාධයකට පත්වසිටි අවදියක(1753) බුරුමය, සියම ආදී ආසියාතික රටවලින් රැගෙනවිත් යළිමෙහි ස්ථාපනය කරණුලැබුයේද ධර්මාශෝක රජතුමන්ගේ සමයේ ධර්මප්‍රචාරයට යොදාගත් ඉංදියාවේදී **පාලිබසට** පෙරළනලද ත්‍රිපිටකධර්මය විමය.

තවද බලංගොඩ ආනන්ද මෛත්‍රී, හේනපිටගෙදර ඤාණසීහ හා රේනුකානේ චන්දවිමල වැනි වියත් ධර්මධර (බොහෝවිට මාර්ගඵල ලාභී) භික්ෂූන් නිවන්මග ප්‍රඥාවෙන් වටහාගෙන සද්ධර්මය දේශණාකළද, බුද්ධගෝෂ හිමියන් විසින් ධර්ම පරිවර්ථනයේදී නොදැණුවත්කමින් සිදුකළ **විකෘතීන්** පෙන්වාදී **නිවැරදිකිරීමට** තරම් එඩිතර නොවූබව මා දරණ මතයයි.

එබැවින් **පාලිබස** අනුසාරයෙන් නොව, අපගේ **සිංහළ** බසෙහි ප්‍රභව **මාගධී හෙළබස** අනුසාරයෙන් හා විසිඑක්වැනි සියවසෙහි පාඨකයාගේ **විද්‍යාත්මක චින්තන පරිචයටද** ගෝචරවන ආකාරයෙන් **නිවන්මග ගවේශණාත්මකව** හා සරළව තේරුම්කරදීම මෙම ලිපියෙන් අරමුණුකරන්නෙමි. තවද අපවිසින් මෙතෙක් එල්බගෙන ඇති **අතීත දෘෂ්ඨීන්** මැනැවින් පැහැදිළි නොවනතාක් **වර්ථමානයේ** නිවැරදි දර්ශණයක් දැකියනොහැකිවන බැවින් යථෝක්ත ඓතිහාසික සාධක විශ්ලේශණයද සැකෙවින් සිදුකළබව සලකන්න.

- නිවනඅරබයා යන ගමනේදී ප්‍රඥාඅධික ඇතැමෙක් ඉහත පියවර සතරම නිමාකරන්නටත් මත්තෙන්ම **සෝථාපන්න** මාර්ගඵලයට පත්වීමේ භාග්‍යලබාගනිත්. **'සෝථාපන්න**' යනු අපසැමව සිරගතකොටඇති **'සොබාදහම් සත්ව ගොවිපලෙන්'** ඔබව නිදහස්වූ බවට කෙරෙන **පළමු සංවේදනයයි.** එහි ප්‍රතිඵලය ලෙස **තිරිසන්, ප්‍රේත, අසුර** හා **නිරය** යන **සතරඅපා** ද්වාරයන් තමාකෙරෙහි සදහටම **වැසීයනුඇත.**

මාගධි හෙළබසට අනුව '**සෝථාපන්න**' යනු '**අසාසිටියා**' යන අරුත්දෙයි. ඉන්පසුව ඔබ අතිශයින්ම ප්‍රමාධවුවද, ඉදිරි සසරගමන පතනා ආකාරයඅනුව සුගතිගාමී **දෙව්, මිනිස්** හෝ ශුද්ධාවාස**බ්‍රහ්මතල** යන **ආත්මභාව හතක** උපරිමයකට සීමාවෙයි. (විශාඛාව සිටුසම්පත් විඳිමින් බොහෝ දරුසම්පත්ද ලැබ ආදර්ශවත් යුගදිවියක් ගතකලේ සෝථාපන්න ඵලයට පත්ව සිටියදීය)

- නිවන්මගෙහි පළමුපියවර වන **ත්‍රිලක්‍ෂණය**(අනිච්ච, දුකඛ, අනත්ත) අවබෝධනොවූ අයෙක් (**ජීවිතය** පිළිබඳව **කළකිරීමට** පත්නොවූ අවස්ථාවක) ඉදිරි පියවර තුන වැඩීමට නිවන් මගට පිවිසීම යනු හුදෙක් **'නිරෝගී පුද්ගලයාට බෙහෙත් තිත්ත වන්නාක්සේම'** දුක්බර වෙහෙසකාරී ව්‍යායාමයක් වන්නේය. තිලකුණෙහි එන **'අනත්ත ලක්‍ෂණය**' අවබෝධවීමෙන්ම නිවන් මගඵල ලද්දාවූ ප්‍රඥාවන්තයින්ද බොහෝ සිටියහ. (**අනත්ත** යනු **න-අත්ත** හෙවත් තමාගේම නොවීම යන **අනාත්මතා** ලක්‍ෂණයයි)
- නිවන්මගෙහි දෙවනපියවරවන **සත්‍යසතර** අවබෝධයෙන් තේරුම්ගැනීම තනිව කළහැකිවන්නේ **බුදු, පසේබුදු** වැනි මහා ප්‍රඥාවන්තයන්ට පමණක් වනබැවින් නිවන්මගට පිවිසෙන අප විසින් පළමුව කළයුතුවන්නේ බුදුන්කෙරෙහි **ශ්‍රද්ධාවෙන්** එම ගැඹුරු විෂයකාරණා සතර **පිළිගැනීම** පමණක්ය.
  සිදුහත් කුමරුන් රජසම්පත් හැරදමාගොස් සයඅවුරුද්දක් මහවනයේ අතිදුෂ්කර කායික හා මානසික ගවේශණයක යෙදුනේ ඔබටත් මටත් ඒසඳහා දුක්විඳීමට ඉඩතබා නොවේ.
- එබැවින් තෙවනපියවර වන **ආර්යඅෂ්ඨාංගික මාර්ගය** ඔස්සේ උපරිම සිහිනුවණින් හා අදිටනින් යුතුව ගමන් කළහොත් අදටත් මාර්ගඵල අත්කරගත හැකි අතිශය දුර්ලභවූ **බුද්ධයුගයක** අවසානභාගයේ අප ජීවත්වනබව සිතන්න.
  ඒ සඳහා සෘජුවම මඟහෙළිකරනා **'ථේරවාද බුද්ධ දර්ශණය**' අදටත් සුරැකිව පවතින්නාවූද **බුද්ධ භාෂිතය** තම **මව්බස** වූද ශ්‍රී ලංකාවෙහි උපතලබන්නට හැකිවීම තමාලද පරමභාග්‍යයක්ලෙස සලකන්න.

## (1)-ත්‍රිලක්‍ෂණය අවබෝධකිරීමඃ

භද්‍රයෞවනයේ සිටි රජකුමරෙක් එදා 'මහල්ලෙක්, ලෙඩෙක්, මරණයක්' ආදී නිමිති දුටුපමණින් අවබෝධකළාවූ '**දුක්ඛසත්‍යය**' අවබෝධ කිරීමට අපට මහළුවන්නටම සිදුවිය. එසේනම් මරණය අවබෝධකිරීමට නම් අපට මැරෙන්නටම සිදුනොවන්නේද?

කෙසේවෙතත් **අනිච්ච**, **දුක්ඛ**, **අනත්ත** යන ත්‍රිලක්ඛණයෙන් අවබෝධ කළයුතු **සසරදුක** මෙතෙක් ඔබට නොදැනීනම් එම අත්‍යවශ්‍ය මූලික සුදුසුකම නොමැතිව **නිවන්තකා** ඔබ යනගමන එතරම් ප්‍රතිඵලය දායක නොවන බවනම් කිවයුතුය

එදා කෝලිත(දේව ගෝත්‍රික-පසුව **මුගලන්** මහතෙරුන්) හා උපතිස්ස(බමුණු ගෝත්‍රික-පසුව **සැරියුත්** මහතෙරුන්) යන මිතුරන්දෙදෙනා '**ගිරග්ග සමජ්ජ**'(ගිරිමුදුනේ සංගෙඩිය හෙවත් ඇතැම්විට මණමේ අන්දරයේ එදා පිටපත) බැලීමටගොස් සසරදුක හඳුනා කළකිරී සත්‍යය සොයායන්නෙමුයි කතිකාවූබව එදා දහම්පාසැලේදී ඉගෙනගත්තා ඔබට මතකද? එසේ නාටකයක් නැරඹීමෙන් **තිලක්ඛණය** වැටහීගිය හේතුවෙන් මූලිකසුදුසුකම්(පළමු පියවර)

සපුරාසිටි ඔවුන් අස්සජි අරහතුන් වහන්සේගෙන් එකගාථාවක් ඇසීමෙන්ම **සත්‍යසතර** අවබෝධකොට(දෙවන පියවර) **සෝථාපන්න ඵලයට** පැමිණිබවත් ඔබට මතකඇත

'යෙ ධම්මා **හෙතුපපභවා** තෙසං හෙතුං **තථාගතෝ** ආහ,
තෙසංච යො **නිරෝධො** එවං වාදි මහා සමණෝ'

(යම් **හේතුඵලදහමක්** හේතුකොට **ඇතිසෙයක්** හටගනීද, එමහේතුන්ද **නවතාලියහැකි** බව මහාශ්‍රමණයින්ගේ වාදයයි)

'යං කිඤ්චි සමුධය ධම්මං සබ්බං තං නිරෝධ ධම්මං'
ඇතිවීමට හේතුවද නැතිකළහැකිබව එම දර්ශණයයි

# නිබ්බානගාමී පටිපදාව-1



CHTG20109123

**<u>පළමු පියවරඃ</u> (තිලක්ඛණය වටහාගැනීම)**

**1)-අනිච්ච**

**2)-දුක්ඛ**

**3)-අනත්ත**

**<u>මාගධී හෙළබස් විවරණයඃ</u>**

- '**ඉච්ච**' යනු කැමැත්තයි. **අන +ඉච්ච =අනිච්ච** යනු තමා කැමතිසෙයින් නොපැවතීමයි.
- '**දුක්ඛ**'-මෙය තේරුම් නොගත් වැඩිහිටි අයෙක් සිටිය නොහැකිය.
- '**අත්ත**' යනු 'තමා' යනඅරුත්දෙයි **අන +අත්ත =අනත්ත** යනු තමා හෝ තමාගේ නොවීම හෙවත් **අනාත්ම** ලක්‍ෂණයයි.

**<u>සංක්‍ෂිප්තයඃ</u>**

ද්‍රව්‍ය **තමාගේ** නොවන්නාවූද(***අනත්ත***), තමා **කැමති**සේ නොපවත්නාවූද(***අනිච්ච***) අපලද 'ජීවිතය' **දුක** හා **අසන්තෘප්තිය** උරුමකරයි(***දුක්ඛ***).

- පාඩම්කිරීම පහසු වුවත් වටහාගැනීම අපහසුවූ එම **අනාත්ම ලක්‍ෂණය** ගැඹුරින් වටහාගත් පමණින්ම ඉතිරිමග නිතැතින් ගෙවා **මගඵල** ලද ප්‍රඥාසම්පන්න පුද්ගලයින් පිළිබඳව නිදසුන් දැක්විය හැකිය.
- නිවනට පියවර සතරක්නම්, පළමු පියවර **අවබෝධයෙන්** පසුකළ පමණින්ම ඔබ **25%** කින් **නිවන්මග** තරණයකොට හමාරබව වටහාගන්න.

**<u>ගැටමුසුතැන්ඃ</u>**

<u>1)-'**අනිත්‍ය**' වශයෙන් අප මෙතෙක් දෘෂ්ඨිගෙනසිටි ලක්‍ෂණය වැරදිද?</u>


**අනිත්‍යය** යනු පදාර්ථයට අයත් පොදු **පරිණාමීය** ගුණයයි. එය **පදාර්ථය** කරණකොටගෙන හටගත් **ජීවය** ටද පොදුවූ ධර්මතාවක් වුවද කළකිරීමට කාරණයක් නොවන අවස්ථා එමටය.

**‘රෝගය අනිත්‍ය වීමෙන් රෝගියා සුවපත්වේ’**


එදා සිදුහත් කුමරුන් **ලෙඩෙක්** දැකීමෙන් වටහාගත් සත්‍යතාව එයවීනම්, අපට බුදුකෙනෙක් බිහිනොවන්නටද ඉඩකඩ තිබුනානොවේද?

<u>2)- බුද්ධයුගයේදී අකුරුශාස්ත්‍රය තිබුනාද?</u>

සිව්හෙළයේ වේධශාස්ත්‍ර පිළිබඳ අධිකාරිත්වය දැරවේ බමුණු ගෝත්‍රිකයන්වූ බැවින් හෙළබසෙහි අකුරු ‘**බ්‍රාහ්මීඅක්ෂර**’ ලෙස නම්වීය. අගසව් සැරියුත් මහරහතන්වහන්සේද බමුණුගෝත්‍රයට අයත්වූහ. ‘**බමුණු**’ යන නමින් අදටත් වරනැගෙන ගම්මාන කොපමණ සංඛ්‍යාවක් ලංකාවෙහි තිබෙනවාද? (බමුණාවිට, බමුණකොටුව, බැමිණියවත්ත........ )



<u>කැප්පිටිගල ලෙන්ලිපියඃ</u>
ප-රු-ම-ක... ශා-රී-පු-ත... හ-පි-රු-මි-ක... බි-ම-ණෙ... ද-ත-ක-හ... ලෙ-ණෙ-ශ
(**මහා සාරිපුත්ත** හිමියන්ට **ගම්පති යක්කගෝත්‍රික** විසින් **දන්දුන් ලෙණය**)
මෙහි ‘**බිමණ**’ යන පදය යෙදෙනුයේ **රාවණයුගයේ** පියාසර තාක්ෂණයට අධිකාරීවූ **යක්ක** ගෝත්‍රිකයන්ටය.
අදටත් ජනවහරෙහි ‘ගමන බිමණ’ වශයෙන් **සිංහළ** භාෂාවෙහි ශේෂව ඇත්තේ අප ආදිවාසීන්ගේ සුහුරුතා නටබුන්ය. පියසැරියක වැනි දළසටහනද එහිදක්නට ඇතිඅතර **ගමන**-යනු ඇවිදයන ගමනත්, **බිමණ**-යනු යාන වාහන විමානආදියෙන් කෙරෙන ගමනත්වීය.
’



<u>හඳපානා විල්ලුව ලෙන්ලිපියඃ</u>
ප-රු-ම-ක අ-භ-යි පු-ත ති-ශ-හ න-වි-ක හ-ලෙ-ණෙ ගො-ත-ම ශ-ම-ණෙ ක-ර-පි-තෙ
**මහ අභයපුත් තිස්ස නාවික** විසින් **ගෝතම ශ්‍රමණ** වෙත **කරවූවගයි**
මෙහි නැව්සලකුණ යොදාඇත්තේ නාවික නාගගෝත්‍රික යන සංකේතයයි
**<u>සැඃ යුඃ</u>**
‘**බුදුන් උපන් ජම්බුද්වීපය**’/**එම්. එස්. දයාරත්න**ශූරීන්ගේ පර්යේශණ ග්‍රන්ථ ඇසුරෙනි

බුදුන්වහන්සේ විසින් පනවනලද **පඥා** හා **ධර්මධර** යන ධූරයන් දෙකකි. ග්‍රන්ථධූරය ලෙසින්ද විටෙක හැඳින්වෙන ධර්මධූරධර භික්‍ෂූන්ට පොත්ගුල්(තලගුල්) හෙවත් පුස්ථකාල භාරකාරීත්වය පැවරිණ. එබැවින් අකුරුශාස්ත්‍රය දියුණුව පැවති බුද්ධයුගයේ ග්‍රන්ථකරණය නොතිබුනේයයි කිවහැකිද? **වෝහාරපබ්බත** ලෙස බුදුන්වහන්සේ විසින්ම හඳුන්වනලද්දේ(ඉසිගිලිති සූත්‍රය) අද **තලගුලුවිහාරය** ලෙසහැඳින්වෙන ලෙන්සංකීර්ණයයි(**වෝහාර**-භාෂාව, **තලගුලු**-තලපත්හි ලියූ පොත්ගුල)

තවද **බුද්ධයුගය**(අධ්‍යාත්මික යුගය-2600BP) පමණක් නොව **රාවණයුගය**(තාක්ෂණ යුගය-<5000BP) පවා සනාථවන අනාවරණය නොකෙරෙන සෙල්ලිපි කොතෙකුත් ලංකාවෙහි ඇතිඅතර, හොරොවුපොතාන ලෙන්ලිපියෙහි 'ප-රු-ම-ක ර-ව-ණ'හෙවත් **මහරාවණ** වශයෙන්ම නම සඳහන්වෙයි.

යථෝක්ත කරුණු ලිපියේ **'නිවන්මග**'සන්දර්භයට කිසිසේත් අදාල නොවනබව ඇතැම්අයෙකුට පෙනුනත්, යම්යම් විෂයකරුණු පිළිබඳ **සැකයක්** සිතක පවතිනතාක් **අචල ශ්‍රද්ධාව** නමැති නිවන්මගට අවශ්‍යම මනෝවස්තුබීජය ගොඩනොනැඟෙනා බැවින්, නිවැරදි ඓතිහාසික කරුණුද සැකෙවින් ඉදිරිපත්කෙරුණුබව කරුණාවෙන් සලකන්න.
පැහැදිලි **අතීතයක්** මත පිහිටාමිසක පැහැදිලි **අනාගතයක්** කිසිදා ගොඩනැඟිය නොහැකිය.

## 2-සත්‍යසතර පිළිගැනීමඃ

නිවනසොයා ගවේශණාත්මකව දෙවන පියවරට එලැඹෙන අප විසින් දැනටමත් ජීවිතයෙහි **තිලක්ඛණය** දැක **'දුක්ඛසත්‍යය'** මොනවට තේරුම්ගෙන හමාරය.

එනමුත් **'සමුධය සත්‍යය'**-(දුක සහේතුක බව) අපට එකවර නොවැටහෙන ඉතාගැඹුරු කරුණකි. තමනට පමණක් මෙසේවූයේ මන්දැයි දුකටපත් බොහෝදෙනා ප්‍රශ්ණකරති. මෙහි සැමට සාධාරණ පොදුබවක් තිබුණිනම් යමෙක් ප්‍රශ්ණනොකොටම දුක විඳදරාගන්නට තිබුණි. පාපකාරී ක්‍රියාවන්හිම නිරතවසිටින සිය අසල්වැසියා සැපෙන් ජීවත්වෙද්දී හොඳමකළ තමනට වූයේ කුමක්දැයි ඇතැමෙක් ප්‍රශ්ණ කරති.
මෙහිදී නිවුටන්ගේ **ක්‍රියා-ප්‍රතික්‍රියා නියමය** මෙන් පැහැදිලි, සමානහා ප්‍රතිවිරුද්ධ ප්‍රතිඵලයක් එවෙලේම ලැබෙන පිළිවෙලක් **චක්‍රීය චලිතයේදී** නොවනබව ඔබ වටහාගතයුතුය. රෝදයක ඇලුනුමඩ පැල්ලම නැවත පාරේ වදින්නේ කොතරම්දුරක් ගියවිටදීදැයි මඳක් සිතාබලන්න.

පෘථිවියෙහි වෙසෙන අපි, සූර්යයාවටා යන **චක්‍රීයගමනේදී** වසරකට තරුරාශි දොලසක ලැගුම්ගන්නා බවත් අනෙකුත් ග්‍රහයන් එම රාශීන්වල ලැගුම්ගන්නා කාලයන්ද අනුව මිහිමත ජීවියෙකුගේ **ජීවනයට ප්‍රතික්‍රියාව** පැමිණීමට වසරගනන් පමාවනඅයුරු **ඉසිවරමුණි** හා **පුලතිසි** ආදී හෙළයේ විසූ මහාඉසිවරුන් ලසුගතකළ සටහන වසරදහස්ගනනකට පසුව අදටත් සම්ප්‍රදායෙන් පැමිණ '**කේන්දරය**' යයිකියා ඔබ අතටද පත්ව ඇතිසැටි බලන්න. ඊජිප්තු හා මෙක්සිකෝ ඉන්කා ආදී ඉපැරණි ශිෂ්ඨාචාරයන්හිද තාරකාශාස්ත්‍රය හාබැඳි නක්ෂත්‍රවිද්‍යාදැණුම භාවිතවූබවට සාක්ෂිඇත.
ඉසිවරුන්ටදවඩා අධික **අසාධාරණ ඥාණයන්ගෙන් පිරිපුන්** අපගේ බුදුන්වහන්සේ විසින් මිහිමත සත්වයා මෙහෙයවනු ලබන න්‍යායධර්ම පහක්(**සෘතු නියාම, බීජනියාම, චිත්තනියාම, කම්මනියාම හා ධම්මනියාම**) වශයෙන් දේශනාකොට වදාලබව ඔබදන්නවාද? එහිදී **සෘතුනියාමය** හා **කර්මනියාමය** එකතුව ඔබඅතට පත්වඇති **විපාකපත්‍රය** නොහොත් කේන්ද්‍රයටත් පරිබාහිර **නියාමයන් තුනක** බලපෑමෙන් විපාක **කාළසටහන** පමණක්නොව විපාකයේ **ස්වභාවයද** වෙනස්වන ආකාරය කෙතරම් සංකීර්ණදැයි බලන්න.




එබැවින් **සමුධයසත්‍ය**( දුක ඇතිවීමට හේතු), **‘නිරෝධසත්‍යය’**-(දුකෙහිඋරුමය නැතිකළ හැකිබව) හා **‘මාර්ගසත්‍යය’**-(දුකෙහි උරුමයෙන් මිදියහැකි මග) යන ගැඹුරු සොබාදම් සංසිද්ධීන් එකවර අවබෝධ කිරීම අපට පහසුකටයුත්තක් නොවනබව ඔබට පෙනෙනවාද?

එසේනම් මින්එහා **නිවන්මග තරණය** කිරීම නවතාදමා ඉපදීමට පෙර හා මරණයෙන් ඔබ්බට කිසිත් නැතැයිකියා මැරෙන්නට පෙර අප්‍රමාදව **ජීවිතය විඳිමට** සැරසෙමුද?

නොඑසේනම් බුදුන්වහන්සේ විසින් අපවෙනුවෙන් සියළුදුක්විඳ අවබෝධකළ ගැඹුරු ධර්මය බෝමැඩ වැඩසිටියදීම හැකිතාක් සරලවශයෙන් සකසා ඉදිරිපත්කොටවදාල **නිවන් මඟෙහි** එතුමන් කෙරෙහි විශ්වාසය **ශ්‍රද්ධාව** උපදවා ගමන්කරමුද?

මෙම නිවන්මග දෙවන පියවරේදී අපට කිරීමටඇතිතේ සත්‍යසතර **පිළිගැනීම** පමණක්වනබව දැන් ඔබට හොඳින්ම වැටහිය යුතුය. එය අපට තත්වාකාරයෙන්ම **අවබෝධවන්නේ** නිවන්දකිනා **ක්‍ෂණයෙහිදීම** පමණකි.

# නිබ්බානගාමි පටිපදාව-2


CHTG20109123

## <u>දෙවන පියවරඃ</u> (සත්‍ය සතර පිළිගැනීම)

1)-**දුක්ඛ සත්‍යය** (ජීවිතයෙහි දුක උරුම බව)

2)-**සමුධය සත්‍යය** (දුක උරුමවීමට හේතූ ඇතිබව)

3)-**නිරෝධ සත්‍යය** (දුක උරුමවීම වැලැක්විය හැකිබව)

4)-**මාර්ග සත්‍යය** (ඊට මගක් ඇතිබව)

ද්‍රව්‍ය **තමාගේ** නොවන්නාවූද(***අනත්ත***), තමා **කැමති**සේ නොපවත්නාවූද (***අනිච්ච***) මේ 'ජීවිතය' **දුක/අසන්තෘප්තිය** උරුමකරයි(***දුක්ඛ සත්‍යය***).

<u>ජීවිතය දුකද සැපද?</u>

සැමට පොදුවූ සොබා සම්පතක් අසමබරව(**ස්වාර්ථයේ**) විඳින්නට යාමේ ඵලය ලෙස සැපදුක් අසමබරවූ **වර්ථමානයක්** විඳිමින් අප ජීවත්වන්නෙමු. අපවිසින් **අතීතයේදී** උපයා ගන්නාලද උරුමය අසමබරවූ බැවින්මිස නොඑසේනම් ජීවිතයේ දුක හා සැප සමබරය. **අනාගතය** හෝ සැපවත් කරගැනීමට කැමතිනම් වර්ථමානයේදී **පරාර්ථයේ** හැසිරිය යුතුය.

**දානයඃ** පරාර්ථයෙහි හැසිරීම **ශීලයඃ** පරාර්ථය උදෙසා සවාර්ථයේ හැසිරීමෙන් වැලකීම
**භාවනාවඃ** දිශාවක් නොමැතිව දුවන මනස දෛශිකයක් බවට පත්කිරීම

'සබ්බ පාපස්ස අකරණං'(**ශීලය**) 'කුසලස්ස උපසම්පදා'(**දානය**)
'සචිත්තපරියෝ දපනං'(**භාවනාව**) 'ඒතං බුද්ධානු සාසනං' (**බුද්ධ සාසනයයි**)

**'ශ්‍රද්ධාව'** නමැති මනෝභාවය පුද්ගලයාට අවශ්‍යවන්නේ මෙහිදී හා **මෙතැනදීම පමණක්** වනබව මා ප්‍රත්‍යක්‍ෂයෙන් නිර්භයව ප්‍රකාශකර සිටිමි.

නිදසුනක් ලෙස ඔබඉදිරියේ **වගුරක්** හා ඉන්එහා **ක්‍ෂේම භූමියක්** පෙනෙයි. ගැඹුරක් නොදන්නා බියකරුවූ වගුරෙන් එගොඩට යායුතු වුවත් ඊට බියෙන් බලාසිටිනා ඔබට, පෙර එගොඩවූ අයෙක් එගොඩෙහිසිට ඔබ පයතබා යායුතු ආකාරය පෙන්වාදෙයි. දැන් ඔබට අවශ්‍යවන්නේ කුමක්ද? එතෙරව මගකියන්නා කෙරෙහි අචල **විශ්වාසය**(ශ්‍රද්ධාව) ඇතිව පයතැබීම පමණකි.

- **සංසාරය** නමැති මඩවගුර තරණය කිරීමට තථාගතයන් වහන්සේ විසින් පෙන්වනලද මාර්ගය **'ආර්යඅෂ්ඨාංගික මාර්ගයයි'**
- **<u>සෝවාන් ඵලයඃ</u>** මාර්ගය නිමාවේඇති ක්‍ෂමභූමිය **සෝථාපන්න** භූමිතලයයි. එය ඔබට **සුවදායී** තාවකාලික නවාතැනක් වනබැවින් කැමැතිනම් එහි රැඳියහැකි ආත්මභාව ගනන **හතකට** සීමාවෙයි. සතර අපා ද්වාරයන් සදහටම වැසීගිය බැවින් සම්‍යදෘෂ්ඨික දේව, සමෘධිමත් මිනිස් හෝ ශුද්ධාවාස බ්‍රහ්මතලයෙක උපතලබා ඉතිරි මගඵලයන් පූරණයකළහැකි වන්නේය.
- **<u>සක්කදාගාමී ඵලයඃ</u>** **විභව තන්හාව** පමණක් ශේෂවතිබියදී අනෙක් සියළු ග්‍රහණයන්ගේ **චරණ ගම්‍යතාව** ක්‍ෂයකිරීමෙන් තවත් එක්භවයක ඉපදීම සිදුවෙයි.
- **<u>අනාගාමී ඵලයඃ</u>** සියළුම ග්‍රහණයන්හි **චරණ ගම්‍යතාව** ක්‍ෂයකරමින් **නැවතුම** කරා **ළඟාවෙන** අවසන් තලයේදී විභව තන්හාවද ක්‍ෂයකෙරෙනා බැවින් නැවත ඉපදීමක්නැත.

- **නිබ්බානඃ** භූමියක් හෝ භූමිතලයක් හෝ **හේතුප්‍රත්‍යයක ඵලයක්** නොවන්නාවූ '**නිවන**' යන සන්ධර්භය, සියළු භාෂාවන්හි විවරණ(Linguistic defining capacity) සීමාවන්ගෙන්ද බැහැරවෙයි.

එගොඩවූබව පවසමින් ඇතැම් රඟපාන්නන් කොතෙකුත් නාලිකාවෙන් නාලිකාවට දේශනාවන් කළද මඩෙහිගිලී අතුරුදන් නොවන්නට නම්, ඔබගේ අචල විශ්වාසය(**ශ්‍රද්ධාව**) තැබියයුත්තේ ඒකිසිවෙකුත් කෙරෙහි නොව, දසපෙරුමන්සපුරා කල්පයටම පහළවන්නාව සුදුසුකම් මොනවට පූරණයකළ, '**බුද්ධ**' තථාගතයන් වහන්සේ කෙරෙහිම පමණක්ය.
**වීතරාගී** නොවන්නෙකු කෙරෙහි විශ්වාසය(**ශ්‍රද්ධාව**) තබා පසුපසයාමෙන් සිදුවියහැකි විපත **ධජග්ග සූත්‍රයේදී** බුදුන්වහන්සේ විසින්ම දේශනාකොට වදාලහ.

තමා උපන් **ගමරටවත්** තම දහමට හරවාගත නොහැකිවූ ශාස්තෘවරයෙකුගේ දහමක් **අන්ධානුකරණයෙන්** ලබඩිගැනීමට තරම් **අවිචාරශීලී** පුද්ගලයන් විසින් නානා **මිත්‍යා පූජාවිධි** කෙරෙහි ශ්‍රාවකයා යොමුකරනවා හැරෙන්නට ගැඹුරු **නිවන්මග දර්ශණය** පෙන්වාදෙන්නේ කෙසේද?
**'පඤ්ඤාවන්තස්ස අයංධම්මෝ  නායං ධම්මෝ දුපඤ්ඤස්ස**'
මාගේ ධර්මය නුවණැතියන්ට මිස, මෝඩයන් සඳහා නොවේ.
අඩුතරමින් **ඉතිහාසකරණයේ** යම් විකෘතියක් යම්යුගයක හෝ සිදුවඇතිබව සිතීමට තරම්වත් සිතනොනැමෙනා, **බාලවියේ දහම්පාසලේ** ඉගැන්වූ පාඩම් වලටම දැඩිව එල්බගන්නා, ගවේශණශීලී නොවන, **දෘෂ්ඨී සංරක්‍ෂණවාදී අවිචාරශීලී** මනෝභාවයක් ඇත්තවුන් තවදුරටත් **නිවන්මග තරණයට** සුදුසුනොවනා බව කණගාටුවෙන් වුවද ප්‍රකාශකරන්නට සිදුවඇත.

මක්නිසාදයත් **ආර්යඅෂ්ඨාංගික** මාර්ගයෙහි පළමු පියවරේදීම '**සං මා දිට්ඨි**' යයි කීලෙසින් චිත්තසන්තානයෙහි එල්බගත් අතීත **දෘෂ්ඨීන්** සියල්ල කපාහැර 'සිත' විනිවිද පෙනෙනා පිරිසිදු ජලයක් මෙන් **ප්‍රභාෂ්වර** කරගතයුතුවන අවස්ථාවේදී **දැඩි දෘෂ්ඨීවල** එල්බගෙන සිටීම බාධාවක් වනබැවිණි.
**ත්‍රිලක්‍ෂණය** අවබෝධකොට, අචලවූ **ශ්‍රද්ධාවෙන්** යුක්තව **සත්‍යසතර** පිළිගත් ඔබ, මේවනවිටත් නිවන්මගෙහි අඩක්(50%)ක් තරණයකොට '**සද්ධස්ස කුළපුත්තස්ස**' යන උසස්පදවියට පත්වසිටිනාබවත් **නිබ්බාන පඨිපදාවෙහි** පළමු උපාධියවන '**සෝථාපන්න**' ඵලයට ඇත්තේ තවත් කෙටිදුරක් පමණක්බවත් සතුටින් මෙනෙහි කරන්න.

# 3-ආර්ය අෂ්ඨාංගික මාර්ගයෙහි ගමන්කිරීමඃ

නිවන්මගෙහි පළමු පියවරේදී '**තිලක්ඛණය**' මැනැවින් දැන ජීවිතය **පරමාර්ථයක්** නොවනබව වටහාගත් ඔබ දෙවන පියවරේදී බුදුන් කෙරෙහි අචල ශ්‍රද්ධාව උපදවා '**සත්‍යසතර**' තම ඉදිරි **ගවේශණ** ඉලක්කය ලෙස පිළිගත් පමණින්ම විමුක්ති මාර්ගයෙහි **අඩක් 50%** ගෙවා නිමකර '**සද්ධස්සකුළපුත්ත**' පදවියටපත්ව ඇති බැවින් පෙර ආනන්තරිය කර්මයක් නොවීනම් **සතරඅපා ද්වාරයන්** ඔබවෙනුවෙන් **විවෘතනොවනාසේ** දැනටමත් වැසීගොස්ඇතිබව **සතුටින්** සිහිකරන්න.

# ආර්යය අෂ්ඨාංගික මාර්ගය

## නිබ්බානගාමී පටිපදාව-3



**ශික්‍ෂාමූල මාර්ගයඃ**

1)-**සම්මා දිට්ඨී** -------නිවැරදි දෘෂ්ඨිය
2)-**සම්මා සංකප්ප** ---නිවැරදි සංකල්පණා
3)-**සම්මා වාචා**-------නිවැරදි වචනය
4)-**සම්මා කම්මන්ත**--නිවැරදි ක්‍රියාන්විතය
5)-**සම්මා ආජීව**------නිවැරදි වෘතය(චර්යාව)
6)-**සම්මා වායාම**-----නිවැරදි උත්සාහය(වීර්ය්‍යය)
7)-**සම්මා සති**---------නිවැරදි චිත්ත ඒකාග්‍රතාව
8)-**සම්මා සමාධි**------නිවැරදි සමාධිය

මනෝ
කාය
මනෝ

CHTG20023923

මඟට පයතබනා මොහොතේම **නිවැරදි දෘෂ්ඨියක්** ඇතිවන්නේ කෙලෙසකදැයි බුද්ධගෝෂ හිමියන්ගෙන් ඇසීමට ප්‍රශ්ණයක්ඇති නමුදු, **නිවන** යනු හුදෙක් මතු භවයකට **ප්‍රාර්ථනා පරමාර්ථයක්** පමණක්ම නම් **ප්‍රමාධය**ම්ස එහි අවුලක්දනැත

**පඤ්ඤාමූල මාර්ගයඃ**

1)-**සං <u>මා</u> දිට්ඨී** -----දෘෂ්ඨි වර්ධනයෙන් **<u>වැලකිම්</u>** (අතීත **නටබුන්** කපාහැරීම)
2)-**සං <u>මා</u> සංකප්ප**--සිතුවිලි වර්ධනයෙන් **<u>වැලකිම්</u>**(අනාගත **සිහින** කපාහැරීම)
3)-**සං <u>මා</u> වාචා**------වෝහාරයේ මුලාවෙන් **<u>වැලකීම</u>** (බසෙහි ප්‍රථමාවිභක්තියේ **මමායනයෙහි** දැඩි බැඳුම කපාහැරීම)
4)-**සං <u>මා</u> කම්මන්ත**--මෙම මොහොතේ ක්‍රියාන්විතයන්ගෙන් **<u>වැලකීම</u>**
5)-**සං <u>මා</u> ආජීව**-----මෙතෙක් නියැලුනු **ශික්‍ෂා** වෘතයන්ගෙන් **<u>වැලකීම</u>**
6)-**සම්මා වායාම**----නිවැරදි උත්සාහය(ශරීරයේ නොව මනසේ වීර්ය්‍යයවැඩීම)
7)-**සම්මා සති**--------නිවැරදි චිත්ත ඒකාග්‍රතාව(බාහිර **සංඥා නිරෝධය** නොව මනසින් **සංකාර** සදනා හේතු-**සමුධය නිරෝධය**)
8)-**සම්මා සමාධි**-----නිවැරදි සමාධිය (**සමතය** නොව **විදස්සනාව** වැඩීම)

'**දිට්ඨේ දිට්ඨමත්තං භවිස්සති ----**' යන සතරපද ගාථාව අසමින්ම අරිඅටමග පළමු අධියර තුන තරණයකළ **දාරුචීර** එකවරම උතුම් **අරිහත්ඵලයට** පත්වූහ. එනයින් **ප්‍රඥාමූල ආර්යඅෂ්ඨාංගික මාර්ගයේදී** අතිදුශ්කර ශීල පඨිපදා වෘත සමාදන්වීම හෝ කමටහන් වඩමින් යෝගාවචර දිවිපෙවතක් ගතකිරීම හෝ අත්‍යවශ්‍යම කාරණා නොවනබව මොනවට සනාථවෙයි.

"නිරතුරුවම **අතීත** නටබුන් කරතබාගෙන, **අනාගත** මන්දිර ඉදිකරමින් දිවයන සිත, **වර්ථමානය** තුල අල්ලාගෙන '**මම**' කවිදැයි විමසීම යනු **විදර්ෂණාවයි.**"

මෙතරම්දුරක් **නිවන්මග** ගෙවා '**සද්ධස්ස කුළපුත්ත**' බවටපැමිණ සිටිනා ඔබ කෙරෙහි මින්මතු **සතරඅපා** ද්වාරයන් විවෘතනොවනා බව විස්වාසයෙන් පවසමි

**මාගධිහෙළබස් විවරණය** අනුව **මා**-යනු වැලකීමද **සං**-යනු වර්ධනයද වේ. හෙළයේ යළි නිර්මළ **ථේරවාදී** බුදුදහම ඉස්මතුකළ අතිපූජ්‍ය **මීමනපලානේ සිරිධම්මාලංකාර** අරහත් සඟරුවනගේ හෙලිදරව්ව නොවන්නට මාවැන්නකුට සැබෑ **ප්‍රඥාමූල අරිඅටමග** කිසිසේත් ග්‍රහණය නොවන්නට තිබිණි.

අවසාන පියවර වශයෙන් ඉදිරිපත්කෙරෙනුයේ සමස්ථ බෞද්ධදර්ෂණයම කැටිකර 'ජීවනය' නම් **ස්වභාවසංසිද්ධිය** විදර්ශණාඇසින් දකිනා **'පටිච්චසමුත්පාද' ධර්මයයි**'.

# 4-පටිච්ච සමුත්පාද ධර්මයඃ

**පටි**(ගැටගැසීම) + **ඉච්ච**(කැමැත්ත) = **පටිච්ච**(කැමැත්තෙන් ගැටගසාගත්)
**සමුධය**(හේතු) +**උත්පාද** = **සමුත්පාද**
**සවකැමැත්තෙන් පටලවා ගැටගසාගන්නාලද ජීවන චක්‍රය**
**පටිච්ච සමුත්පාද ධර්මතාවයයි**

ඒතං සන්තං ඒතං පණිතං සබ්බසංකාර සමතෝ
සබ්බූපදි පටිනිස්සග්ගෝ තණ්හක්ඛයෝ විරාගෝ නිරෝධෝ නිබ්බානං

"එය **ශාන්තය**, එය **ප්‍රණිතය**. සියළු **ගෙතීම්** අහවරවූයෙන් **ඉතුරුම්පට** ලිහීඇත. **තන්හාවක්‍ෂයවීමෙන්** සිත **රාගයෙහි** නොඇලී නැවැත්ම නම් **නිබ්බානයට** පත්වඇත."

## විද්‍යාත්මක විවරණයඃ

- **මිරිඟුව**, **මිත්‍යාව** හා **මැජික්** ඇස්බැන්දුම් යනවැරදි දැකීම් ගවේශණයෙන් හා විමර්ශණබුද්ධියෙන් මැන **ඇත්ත ඇතිසැටියෙන්** වටහාගැනීමේ වේදය **විද්‍යාවයි**
- **ජීවනය** නමැති අතිශය සංකීර්ණ සංසිද්ධියට භෞතික **පදාර්ථයෙන්** තොරව කුමණාහෝ අර්ථදැක්වීමක් ඔබට කළහැකිද?
- එසේනම් විද්‍යාත්මකව පිළිගත්, **පදාරථයේ පරිණාමීය සංසිද්ධිය** ජීවයටද පොදුවූ සනාථන ධර්මතාවයක් නොවන්නේද?
- **පරිණාමයේ** යම් ප්‍රාග්අවධියක ශුද්‍රපරිමාණයේ **ඇල්ගී** හා **බැක්ටීරියා** ලෙසින් පහළව ක්‍රමයෙන් පරිණාමයවී **ශාඛ**(flora) හා **සත්ව**(fauna) වශයෙන් ලොවෙහි **ජීවය** හටගැන්ම සිදුවූබව විද්‍යාත්මක පිළිගැනිමයි
- එසේ හටගත් **'ජීවය'** සත්වයා අරබයා පමණක් '**ජීවනය'** නමැති අවිච්චින්න සංසිද්ධියක් බවට පත්වනුයේ **සිත**(Mind) නමැති අතිශය සංකීර්ණ අභෞතික **යාන්ත්‍රණය** සත්වයාතුල හටගැන්මත් සමගය

- විද්‍යාව අදටත් '**සිත**' යනු නොවිසඳිනු ප්‍රහේලිකාවක් සේ සලකනුයේ ඔවුන් හඳුනාගත් පදාර්ථයෙහි මූලික සංඝටක අතරට තවමත් **ආකාශ ධාතුව**(the vacuum) නොවැටෙනා බැවින්ය. එනමුත් ක්‍රි පූ 6 වැනිසියවසෙහි විදනාඥයෙක්(**තථාගත**) එදා, **සිත** යනු අවකාශ ධාතුවෙහි චක්‍රීය ශක්තිචලිතයක්සේ හඳුනාගත්බව '**විඤ්ඤාන වර්ධය** (සුලිය)' ලෙස එය නම්කිරීමෙන්ම පැහැදිළිනොවන්නේද?
- චාල්ස් ඩාවින්ගේ '**ජීවයේ භෞතික පරිණාමීය මූලධර්මය**' ට යටින්දිවෙන අදිසි හේතු **කාරකය** වනුයේ තථාගතයන් වහන්සේගේ '**ජීවනයේ භවපරිණාමීය මූලධර්මය**' හෙවත් '**පටිච්චසමුත්පාද ධර්මය**' බව ප්‍රත්‍යක්ෂමූල විශ්ලේෂණයේ නිගමනයයි.
- පුද්ගලයා/සත්වයා විසින් මනසින්සිතා කරනුලබන **කාර්යයන්හි** මතකසටහනක් DNA ශෛලතුල ප්‍රවේණිගත වන්නාසේම '**උපාදාන**' කර්ම නියැදියක් ලෙසින් 'විඤ්ඤාණ ගබඩාවෙහි' තැන්පත් කෙරෙනුයේ **යළිඉපදීම**(rebirths ) සහිත **ජීවනචක්‍රයක්** නිර්මාණය කරමිණි
- අනෙක් සියළු පාරිසරක **ස්වාභාවික චක්‍රයන්** මෙන්ම යථෝක්ත **ජීවනචක්‍රයද** පරිණාමයට බඳුන්වන බැවින් ලේනෙකුට මිනිසත් බවට පත්වන්නට කොපමණ කාලයක් ගතවන්නට ඇත්ද? එම මිනිසා මිනිසත්බව ඉක්මවා බුදුකෙනෙකුන් බවට පරිණත වන්නට තවකොපමණ කාලයන් ගතවන්නට ඇතිදැයි සිතාගත හැකිය?
- බුදුන්වහන්සේ විසින් සියවස් 26 කටපෙර ලොවට හෙළිකළ '**පටිච්චසමුත්පාද ධර්මය**' යනු **භවපරිණාමයේ** මූලයාන්ත්‍රණයයි.

අදවනවිට ලොවපුරා පැතිරපවත්නේ කුමණ බුද්ධාගමක්දැයි සැක සිතෙන තරමටම දර්ශණය විකෘතීභාවයට පත්වඇති බැවින් **නිවන** යනු හුදෙක් **ප්‍රාර්ථනා** පරමාර්ථයක් පමණක් විඇත. ඇතැම් රටවල නිකායයන්හි භාවනාවයයි සලකන්නනේ නිශ්චලව ඇස්පියාගෙන තමාදෙස බැලීමයි මෙය බොහෝවේලා වැඩීමෙන් මානසික ඒකාග්‍රතාව (mindfulness ) හා අන්තර්ඤාණය(intuition ) ලැබෙනා බව දේශකයන් වහන්සේලාගේ ඉගැන්වීමයි. මේ කෙරුවාව තුලින් **නිවන** යන ගැඹුරු විමුක්ති දර්ශණයක ඡායාවක් හෝ දැකියහැකිවේදැයි නිවැරදි මගෙයි මෙතෙක්දුරක් තරණයකළ ඔබටම වැටහෙනුඇත. ඒවනාහි ආරය්‍යඅෂ්ඨාංගික මාර්ගයේ අටවැනි සංධියේදී **විදර්ශණාව** අතහැර 'අසම්මා සමාධි' හෙවත් **සමතසමාධි** නම් වැරදි මාවතට පිවිසීමට නිකායවාදීන් දරණ උත්සාහයකි. එහිවඩා දුරදිගයාමෙන් අවසන **උමතුභාවයට** පත්වීම හෝ මරණින්මතු කාළය අතිශය ප්‍රමාධව ගතවෙනා **අසඤ්ඤතා තලයන්හි** උපතලැබීම හෝ සිදුවියහැකිය.
තවත් බොහෝ සැදැහැවතුන් භාවනාවයයි ඇස්දෙක පියාගෙන '**අසම්මා සංකප්ප**' නොහොත් අතීතයේ **නටබුන් අතගෑම** හෝ අනාගතයේ **සිහිනමැවීමෙහි** නිරතවෙති.

'දීඝං බාලානං සංසාරෝ  සද්ධම්මං අවිජානතී'
ධර්මය පටලවාගත් මෝඩයාට සංසාරය දිගය

දැන් නිවන්මගෙහි අවසන් අදියරට පැමිණසිටින ඔබ සියළු උඩඟුකම් අත්හැර ඌරුකොටුවක් හෝ කුකුල් ගොවිපලක් සිහියට නගාගත යුතුවඇත.

# නිබ්බානගාමී පටිපදාව-4

**පටිච්ච සමුත්පාද ධර්මය**

-කිච්චට තරහගන්න එපා-

සත්වගොවිපල: සංසාරය
පාලකයා : ස්වභාවධර්මය
ආහාර : රූප, හඬ, සුවඳ, රස, ස්පර්ශය, ප්‍රීතිය



## ඔබ සත්ව ගොවිපළකට සිරවී වැඩෙනා සතෙකි. ඔබේ සතුටනම් සහෘදයා පරදා ආහාර වැඩිපුරගැනීමයි.

මින් ගැලවීමට නම් **'සිරගතවීමේ යාන්ත්‍රණය'** අවබෝධකළ යුතුමය

1-'අවිජ්ජා පචචයා සංකාරා'(ප්‍රථමා විභක්තියේ 'මම'යන **මුලාව** නිසා ආහාර සංඥාවන්ගෙන් **කැළඹීම**(ප්‍රේරණයවීම)

2-'සංකාර පචචයා විංඤාණ'(කැළඹීම **මතකයක්** බිහිකරයි)

3-'විංඤාණ පචචයා නාමරූප'(**නාමකරණයෙන්** මතකය ගබඩාකෙරේ)

4-'නාමරූප පච්චයා සලායතන'(සැලෙනා ආයතන හෙවත් **'පසිඳුරන්'** නමැති පෙනෙනා දෙපාර්ථමේන්තු පහක නඩත්තු මෙහෙයුම් හා ඉපැයීම් ගිණුම් පවත්වාගැනිම සිදුවන්නේ, අදෘෂ්‍ය 'මානයේ ඇස' හෙවත් '**මනස**' යන හයවැනි ඉන්ද්‍රිය මගින්ය)

5-'සලායතන පච්චයා ඵස්සෝ'(**ඉන්ද්‍රියයන්** විසින් බාහිර සංඥාවන් නිරතුරුව **ස්පර්ෂ** කරති)

6-'ඵස්ස පච්චයා වේදනා'(**ස්පර්ෂයෙන්** කම්පනයවන සලායතන මගින් **වේදනා** තරංගයන් මනසකරා සම්ප්‍රේශණය කෙරෙයි)

7-'වේදනා පච්චයා තන්හා'(**වේදනාවන්** බදාගැනීම **තන්හාවයි**)

8-'තන්හා පච්චයා උපාදාන'(**තන්හාවෙන්** ඇලීම හා ගැටීම නිසා 'ක්‍රියාවේ ප්‍රතික්‍රියාව **කර්මය**' ලෙසින් ගබඩාකෙරේ)

9-'උපාදාන පච්චයා භවෝ'(යළි යළි ඉපදීමේ යාන්ත්‍රණයයි)

***'රාගක්ඛයෝ දෝසක්ඛයෝ මෝහක්ඛයෝ නිබ්බානං'***
**ඇලීමට ගැටීමට** හේතුවූ **මුලාවට** හසුනොවීම **විමුක්තියයි**

**'සෝථාපන්න'** යනු **නිදහස්වීමේ** පළමු **නිවේදනය** අසන්නට ලැබීමයි. එසැනින්ම **සතරඅපා** ද්වාරයන් ඔබවෙනුවෙන් සදහටම **වැසීයන** අතර, ඉදිරිය කැමැත්තපරිදි සැපවත් දෙව් මිනිස් ආත්මභාව **හතකට** පමණක් සීමාකෙරෙයි.

**එම යාන්ත්‍රණය වැඩිදුරටත් විග්‍රහකරමු ඃ**

1. **අවිද්‍යා පච්චයා සංඛාරා**-(**මෝහය** හේතුකොට **බාහිරසංඥාවන්** හා **මතක දත්තයන්** අලලා **රූපරාමු ගෙතීම**)
   මමය මාගේය යන **ප්‍රථමා විභක්තියෙන්ම** සත්ත්වයා සංසාරගතවෙයි.
2. **'සංඛාර පච්චයා විඤ්ඤාණ'** (ගොතනලද රූපරාමු මගින් **විඤ්ඤාණය** සකස්වේ)
3. **'විඤ්ඤාණ පච්චයා නාමරූප'** (නම්නොකරණලද රූපරාමු විඤ්ඤානයේ ගබඩාකළ නොහැකි බැවින් අනුෂය කෙරෙනුයේ නාමිකව හඳුනාගන්නා රූපරාමු පමණකි. එබැවින් නාම රූප දෙකෙහි ඇති අන්‍යෝන්‍ය සබඳතාව මනාව පැහැදිලිවෙයි)
4. **'නාමරූප පච්චයා සළායතන'** (භෞතික ෂඩ්ආයතනයන්ගේ ප්‍රධාන සංඥාමෙහෙයුම් මැදිරිය පිහිටාඇත්තේ **විඤ්ඤාණ** ගබඩා සංකීර්ණයේය. එබැවින් විඤ්ඤානයේ ඇති නාමරූප සංචිතය කරණකොටගෙනම සංවේදී ඉන්ද්‍රිය ආයතන පද්ධතිය පවත්වාගැනෙයි)
5. **'සළායතන පච්චයා ඵස්සෝ'** (බාහිර සංඥාවන් **ස්පර්ෂ** කෙරෙනුයේ **සළායතන** මගින්ය)
6. **ඵස්සපච්චයා වේදනා**(**ස්පර්ෂය** හේතුකොට **වේදනාව** මණාස කරා සංප්‍රේශණය කෙරෙයි )
7. **'වේදනා පච්චයා තන්හා'** (සැප හෝ දුක වශයෙන් **වේදනාව** අරභයා ඇතිවන අල්ලාගනීම **තන්හාව** නම්වෙයි)
8. **'තන්හා පච්චයා උපාදාන'** -( සුභ හෝ අසුභ **සංඥාවෙන්** යුතු මනෝභාව පැකේජයන් **කර්මබීජයන්සේ** විඤ්ඤාණ බැංකුවෙහි තැන්පත්කෙරේ )
9. **'උපාදාන පච්චයා භවෝ'** (උපයාගත් තැන්පතු හෙවත් **කර්ම** හේතුකොටගෙන මතුභවයන් සකස්වේ)

නිවන අරමුණුකොට යායුතු **පියවර සතරකින්** හෙබි මාවතෙහි නිමාව මෙම ජීවන යාන්ත්‍රණය ඇතිසැටියෙන් තේරුම්ගැනීමත් සමග **නිවනින්ම** නිමාවනුයේය. එයට ගතවන කාළය පුද්ගලයාගේ **ප්‍රඥාමට්ටම** අනුවද පළමුපියවරේදී **තිලක්ඛණය** අවබෝධකළ මාත්‍රාව අනුවද අඩු වැඩිවන අතර තමන්ගේ **ප්‍රාර්ථනා බෝධිය** අනුවද ප්‍රමාධ වන්නේය.

## සතර කමටහන්ඃ

නිවන අවබෝධකරගැනීමේ ව්‍යායාමයේදී(**සම්මා වායාම**) වනගතව වීර්ය්‍ය වඩනා යෝගාවචර භික්ෂූන්, තමසිත නොයෙක් ආරම්මණයෙන් වික්ෂිප්තවූකල්හි බුදුන්වහන්සේකරා යළි පැමිණ කමටහන් උගෙන නැවතගොස් බවුන්වැඩීමෙන් මගඵල ලබන්නාහුය.

**1-මෙත්තානුස්සතිය**

**2-අසුභානුස්සතිය**

**3-මරණානුස්සතිය**

**4-බුද්ධානුස්සතිය**

තමන්ගේ සිත **බියෙන්** හෝ **ද්‍රෝශ** දර්ශණයකින් විපිලිසරවූයේ නම් එවිට මෙම අනුපිළිවෙලින්මද **රාග** ආරම්මණයකින් විනම් දෙවැන්නෙන් පටන්ගෙනද භවනාව වැඩීමෙන් නැවත නිවන්මගට පහසුවෙන් ප්‍රවිශ්ඨවිය හැකිය.

**මෛත්‍රීයෙන්** සිත **සන්සුන්** කිරීමද **අශුභය** හා **මරණය** මෙනෙහිකිරීමෙන් නැවත ඔබතුල **තිලක්ඛණ** අවබෝධය පිළිබඳ පැවති ඌණතාව සපිරීමද අවසානයේ **පටිච්චසමුත්පාද ධර්මයේ බෙදාදැක්වීම** මෙනෙහිකිරීමෙන් **නිවන** අවබෝධවීමද එමගින් ඉලක්කකෙරෙයි.

## සතරසතිපට්ඨානයඃ

තවද **නිවන්මගින්** සිත බැහැරකරනා කැරණක්වනුයේ සංසාරපුරුද්දඅනුව සිත හැමවිටම වර්ථමාණයෙහි නොරැඳී **සංකල්පණාවන්** ඔස්සේ අතීතයට හෝ අනාගතයට දිවයාමට තැත්කිරීමයි. සතර සතිපට්ඨානයෙන් අරමුණුකෙරෙනුයේ ඈතදුවනසිත අල්ලා කයසම්පයෙහිම රඳවා(**කායගතාසතිය**) **නිවනට** යොමුගතකිරීමයි.

1-**කායානුපස්සනා** (සක්මනෙහිදී හෝ හුස්මගැනීම් හෙළීම ආදී ක්‍රියාකාරකම් අනුසාරයෙන් දිවයානොදී සිත අල්ලාතබාගැනීම)

2-**වේදනානුපස්සනා** (ශරීරයට දැනෙන වේදනාවන් අනුසාරයෙන් මෙනෙහිකරමින් දිවයානොදී සිත අල්ලාතබාගැනීම)

3-**චිත්තානුපස්සනා** ( සිතුවිලි නිතර වෙනස්වනසුළු ආකාරය සිතමින් ඒ අනුසාරයෙන්ම සිත දිවයානොදී අල්ලාතබාගැනීම)

4-**ධම්මානුපස්සනා** (අල්ලාගන්නාලද සිත, **පටිච්චසමුත්පාද ධර්මය** කෙරෙහි යොමුගතකොට නිවන් පසක්කිරිම)

## විශ්වයෙන් ලැබියහැකි සංවේදනයේ පිටුවහලඃ

නිවන්මග තරණයට **විශ්වශක්තියේ** පිටුවහල ලැබියහැකි ස්ථාන හතරක් පිළිබඳව **මහාපරිනිබ්බාන සූත්‍රයෙහි** බුදුන්වහන්සේවිසින් අනඳ තෙරුන්අමතා දේශනාකොටඇත.


'චත්තාරි මානි ආනන්ද, සද්ධස්ස කුළපුත්තස්ස දක්කණියානං **සංවේජණියානං** ඨානං කතමානි චත්තාරි' පිහිටීම් සතරක්ඇත ආනන්දය, **ශ්‍රද්ධාවන්ත** කුළපුතුන් විසින් දැක සංවේජනය කළයුතු **එකසමාන දුරින් හා දිශාවෙන්** පිහිටි සථාන සතරක් ඇත.

1-උපත සිදුවූ **ලුම්බිණිය**---[ **ලු**(හෙලූ) +**බිණි**(ගර්භය) = **ලු බිණි** => **ලුම්බිණි** ]

2-බුද්ධත්වයටපත් බෝමැඩ **බුද්ධගයාව**---[**බුද්ධ** +**අනුගහා** =**බුද්ධගහා** => **බුද්ධගයා** ]
(බුදුන්විසින් අනුග්‍රහ දක්වනලද බෝමැඩ)

3-ධම්සක්පැවතුම් **ඉසිපතනය** ---[**ඉසින්**(සෘෂිවරුන්-අරහතුන්)+**පතනය**(බැස්ස)=**ඉසිපතනය]**

4-පිරිණිවනසිදුවූ **කුසිනාරා**---[**කෘෂි** +**නුවර** =කුසිනුවර =>**කුසිනාරා** ]




සියළු බුදුවරුන්ගේ විඥදඥාණ ශක්තිය රැඳීසිටිනා යථෝක්ත ස්ථාන සතරෙහිදී නිවන්අරමුණු භාවනාවක යෙදෙන **සද්දස්ස කුළපුත්තස්ස** තත්වයටපත් සැදැහැවතුනට නිවන්මග **සංවේදනය** වන්නේය -------------------------------- Cyril Thalpe Gamage---------15-11-2023